සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2022 ජූලි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2022-08-20
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## <u>A කොටස</u>

(මුළු ලකුණු 20)

## 01 වන ප්‍රශ්නය

පහත දැක්වෙන්නේ එළවළු වගාකිරීම හා විකිණීමෙහි නිරත **සීමාසහිත ඇග්‍රෝ ලයිෆ් (පෞද්ගලික) සමාගමෙහි** ප්‍රධාන ව්‍යාපාරික කටයුතුවලට බාහිර පාරිසරික සාධකවල වෙනස්වීම් හේතුවෙන් මෑතකදී සිදුවූ බලපෑම්ය:

(1) රට තුළට රසායනික පොහොර ගෙන්වීම තහනම් කිරීමට රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන් රසායනික පොහොර ආනයනය කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාර කටයුත්ත නවතා දමා ඇත.

(2) රට තුළ කාබනික පොහොර සඳහා පවතින ඉල්ලුම ඉහළ ගොස් ඇත. කෙසේනමුත් රටතුළ පවතින ඇමරිකානු ඩොලර් [US Dollars (USD)] හිඟකම හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ආනයනය කිරීම් සිදුකිරීමට නොහැකිව ඇත.

(3) ගනුදෙනුකරුවන් බොහොමයක් සෞඛ්‍යය පිළිබඳව අවධානය යොමුකිරීමට පටන්ගෙන ඇති අතර ඉහළ මිල ගණන් යටතේ වුවද කාබනික ආහාර ඉල්ලුම් කරන බැවින් කාබනික එළවළු වගාකිරීමේ හා විකිණීමේ අංශය වඩා ආකර්ෂණීය වී ඇත.

(4) අයිතමයන් ඇණවුම් කිරීමේදී මාර්ගගත ක්‍රමවේදයන් (Online platforms) භාවිත කිරීම ගනුදෙනුකරුවන් අතර ප්‍රචලිත වී ඇත.

(5) දේශගුණික වෙනස්වීම්, කෘෂිකාර්මික අංශය කෙරෙහි අහිතකර වශයෙන් බලපෑනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ඇග්‍රෝ ලයිෆ් (පෞද්ගලික) සමාගමේ** බාහිර පාරිසරික සාධක / බලවේගවලට [factors / forces (PESTEL)] ඉහත සාධකයන්හි බලපෑම **තක්සේරු කරන්න**. (ලකුණු 05)

## **02** වන ප්‍රශ්නය

සංවිධානයකට ඉදිරියේදී ඇතිවන අවදානම් හඳුනාගැනීම සහ එකී අවදානම්වලින් ඇතිවන බලපෑම් මුලිනුපුටා දැමීම හෝ අඩු කිරීම සඳහා වන උපායමාර්ග නිර්වචනය කිරීම සඳහා භාවිත කරනු ලබන ව්‍යුහාත්මක ක්‍රියාවලිය අවදානම් කළමනාකරණ ආකෘතිමය රාමුව වේ. ව්‍යාපාර සංවිධානයක සෑම අංශයකටම තොරතුරු තාක්ෂණයේ විකාශනය බලපෑමක් ඇතිකර ඇත. වර්තමානයේ අවදානම් හඳුනාගැනීමෙන් පටන්ගෙන නියාමනය දක්වා වූ ක්‍රියාවලින් ස්වයංක්‍රියකරණයට තොරතුරු තාක්ෂණය පහසුකම් සපයයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අවදානම් කළමනාකරණ ආකෘතිමය රාමුවක් භාවිත කිරීමෙන් ලැබෙන අවස්ථා / ප්‍රතිලාභ (opportunities / benefits) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අවදානම් කළමනාකරණ උපාංග (tools) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**සීමාසහිත XY (පෞද්ගලික) සමාගමේ** *(“සමාගම”)* අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කරන ලද 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සමාගමක් වන **දේවක ඇසෝසියේට්ස්,** පත්කර ඇත. **දේවක ඇසෝසියේට්ස්** විසින් සිය විගණනය, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව සිදුකරන අතර, ඔවුන්ගේ මතයද සමඟ විගණන වාර්තාව 2022 මැයි 25 දින ලබාදීමට සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) “සහතිකවීමේ කාර්යභාරය (Assurance Engagement)” යන පදය **නිර්වචනය කරන්න.** (ලකුණු 02)

(b) ඉහත කාර්යභාරය සම්බන්ධයෙන් සහතිකවීමේ කාර්යභාරයක ප්‍රධාන සංරචක (key elements) තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

විගණන ආයතනයක් විසින් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලින් සමන්විත තත්ත්ව පාලන පද්ධතියක් ස්ථාපිත කොට පවත්වාගෙන යා යුතුය. සේවාදායක සබඳතා පිළිගැනීම හා අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අධීක්ෂණය, තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග දෙකක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණන ආයතනයක් විසින් සේවාදායක සබඳතා පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාමේදී ක්‍රියාත්මක කළ යුතු අවශ්‍යතාවයන් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) අධීක්ෂණය (monitoring) යටතේ ඇතුළත් වියයුතු ක්‍රියාකාරකම් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

ඔබ, **ABC සමූහ ලැයිස්තුගත සමාගමේ** 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන විගණනයෙහි ජ්‍යෙෂ්ඨ විගණක වේ. සමූහය, දේශීය පරිපාලිත සමාගම් පහකින් සහ බද්ධ ව්‍යාපාරයකින් සමන්විත වේ. එක් දේශීය පරිපාලිතයක් ප්‍රවර්තන වර්ෂය තුළදී අත්පත් කරගෙන ඇත. සමූහය තුළ පවතින අස්තිත්වයන් පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය, සිල්ලර වෙළදාම, සංචාරක, දේපළ සංවර්ධනය, ආයෝජන සහ මූල්‍ය වැනි පුළුල් පරාසයක ව්‍යාපාරික කටයුතුවල නිරත වේ.

සමූහය තුළ පවතින සමාගම්වලින් බහුතරයක් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී එකිනෙක සමඟ ගනුදෙනු කරනු ලබයි. සමූහයේ සියලුම මූල්‍ය සහ ආයෝජන ක්‍රියාකාරකම් පරිපාලක සමාගම විසින් සිදුකරනු ලබයි.

විගණන කණ්ඩායමේ මූලික සාකච්ඡාවේදී සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සහ හෙළිදරව් කිරීම් පිළිබඳව අවධානයක් යොමුකළ යුතු බවත් ඒ සම්බන්ධයෙන් වන ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන ඇති බවට තහවුරු කරගත යුතු බවත් කාර්යයභාර හවුල්කරු විසින් අවධාරණය කරන ලදී. අලුතින් සම්බන්ධ වූ කණ්ඩායම් සාමාජිකයෙකු විසින් කාර්යයභාර හවුල්කරු විසින් ලබාදුන් ඉහත පණිවිඩය අවබෝධ කරගැනීම සඳහා ඔබගේ සහාය පතයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) ප්‍රමාණාත්මක අවප්‍රකාශන ඇතිවීමේ අවදානම සහ ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් **ABC සමූහ ලැයිස්තුගත සමාගමේ** විගණන කණ්ඩායම විසින් සිදුකළ හැකි විගණන පටිපාටි හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**හිමාලි,** වෘත්තීය විභාගයක III වන අදියර සම්පූර්ණ කිරීමෙන් අනතුරුව විගණන සමාගමකට සම්බන්ධ විය. අලුතින් බඳවාගත් පුද්ගලයන් සඳහා අනුස්ථාපන වැඩසටහනක් (orientation program) විගණන සමාගමේ පුහුණු අංශය විසින් සිදු කරන ලද අතර, පුහුණු අරමුණු සඳහා සමහරක් විගණන කාර්යය පත්‍රවල ආකෘති සහ විගණන වාර්තා පරිශීලනය කිරීමට **හිමාලිට** අවස්ථාව ලබාදෙන ලදී. ලබාදුන් එක් විගණන වාර්තාවක "කරුණක් අවධාරණය කිරීම (Emphasis of Matter)" යනුවෙන් වූ ඡේදයක් අන්තර්ගත කර ඇති බවට ඇයට නිරීක්ෂණය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණකගේ වාර්තාවේ මූලිකාංග හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) විගණකගේ වාර්තාවේ අන්තර්ගත කර ඇති "කරුණක් අවධාරණය කිරීමේ ඡේදය (Emphasis of Matter paragraph)" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි ඔහු විසින් අහිතකර මතයක් (adverse opinion) ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක් **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

ඔබ, වරලත් ගණකාධිකාරිවරුන්ගේ සමාගමක් වන **PTS ඇසෝසියේට්ස් (PTS)** සමාගමේ ජ්‍යෙෂ්ඨ විගණකයෙකු වන අතර, දැනට **සීමාසහිත ජයසේන (පෞද්ගලික) සමාගමේ (JPL)** විගණනයෙහි නිරතව සිටී.

සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවකු වන **පීටර්සන් මහතා, JPL** සමාගම **PTS** හි විගණන සේවාදායකයෙකු වූ 2008 වර්ෂයේ සිටම එහි විගණන කාර්යයභාර හවුල්කරු වේ. **JPL** සමාගම, **PTS** හි දිර්ඝ කාලීන සේවාදායකයෙකු හා විගණන හා විගණන නොවන සේවා තුලින් සමාගමේ ආදායමට 20% ක දායකත්වයක් සපයනු ලබන බවට **පීටර්සන් මහතා** විසින් විගණන රැස්වීමේදී සඳහන් කරන ලදී. ඔහු වඩාත් හොඳ සම්බන්ධතාවයක් මෙම සේවාදායකයා සමඟ පවත්වාගෙන ඇති බවත් එම තත්ත්වය ඕනෑම පිරිවැයක් යටතේ කණ්ඩායම විසින් ද පවත්වාගෙන යා යුතු බවත් ඔහු විසින් සඳහන් කරන ලදී. **තිළිණි,** පසුගිය වර්ෂ දෙකක සිටම අඛණ්ඩව මෙම කාර්යයභාර විගණන කළමනාකරු වේ. **JPL** සමාගම විසින් දැනට එහි පුරප්පාඩුව පවතින ගණකාධිකාරී තනතුර පිළිගන්නා ලෙස **තිළිණිට** ඇරයුම් කරන ලද අතර, **තිළිණි** විසින් එම ඇරයුම පිළිගෙන ඇත.

**JPL** සමාගමේ මූල්‍ය වත්කම්වල හානිකරණයන් පරීක්ෂා කිරීම සඳහා ඔබව අනුයුක්ත කර ඇත. අදාල පැහැදිලිකිරීම් ලබාගැනීම සඳහා මූල්‍ය කළමනාකරු සමඟ පවත්වන ලද පළමු රැස්වීමේදී ඔහු විසින් පහත සඳහන් ප්‍රකාශය සිදුකරන ලදී:

> " අදාල වැඩ සම්බන්ධයෙන් මාහට කිසිදු අවබෝධයක් නොමැති නිසා හා ඒවා තරමක ඉහළ ගාස්තුවක් යටතේ වෙනම ම කාර්යභාරයක් වශයෙන් **PTS** හි මූල්‍ය උපදේශක කණ්ඩායම විසින් පිළියෙල කරන ලද බැවින් **PTS** හි මූල්‍ය උපදේශක කණ්ඩායම හරහා මේ පිළිබඳව අවශ්‍ය කරන සියලුම පැහැදිලි කිරීම් ලබාගන්නා ලෙසට මම යෝජනා කරමි."

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත කරුණු සම්බන්ධයෙන් මූලික ආචාරධර්ම මූලධර්මවලට අනුකූලවීමේ තර්ජන (threats) තුනක්(03) **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(b) ඉහත (a) හි හඳුනාගන්නා ලද තර්ජන අවම කරගැනීම සඳහා **PTS** විසින් ස්ථාපිත කළ යුතු ආයතනික මට්ටමේ ආරක්ෂණ ක්‍රම හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

(මුළු ලකුණු 50)

## **08** වන ප්‍රශ්නය

(A) **සීමාසහිත ක්‍රවුන් (පෞද්ගලික) සමාගම (ක්‍රවුන්),** කාමර 61 ක් සහිත තරු තුනේ හෝටලයකි. **නිහාල් මහතා** සමාගමේ සභාපතිවරයා වන අතර, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි විගණනය සිදුකර දෙන ලෙස ඔබගේ විගණන සමාගමෙන් ඉල්ලීමක් කර ඇත. මෙම වෙනස්වීම සම්බන්ධයෙන් **නිහාල් මහතා** විසින් මීට ඉහත සිටි විගණකයන් වෙත දන්වා ඇති අතර, පසුගිය වර්ෂයේ විගණනය කරන ලද ගිණුම් ඔබ වෙත ලබා දී ඇත.

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන සමාගම වර්ෂය තුළදී මෙහෙයුම් කටයුතු සිදුකර ඇත්තේ මාස හයක් (06) ක් පමණි. නමුත් මෙහෙයුම් කටයුතු සිදුකර නොමැති කාලය (non-operating period) තුළ අවම නඩත්තු කටයුතු සිදුකොට ඇත.

පහත සඳහන් ආදායම් ප්‍රකාශන සාරාංශ ඔබට ලබාදී ඇත: (රු.'000)

| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2022 (කෙටුම්පත් කරන ලද)** | **2021 (විගණනය කරන ලද)** | **2020 (විගණනය කරන ලද)** |
|---|---|---|---|
| අයභාරය | 10,224 | 17,370 | 122,624 |
| විකුණුම් පිරිවැය | (8,970) | (14,650) | (70,122) |
| **දළ ලාභය** | **1,254** | **2,720** | **52,502** |
| බෙදාහැරීමේ වියදම් | (322) | (455) | (4,166) |
| පරිපාලන වියදම් | (9,475) | (11,127) | (21,362) |
| මූල්‍ය වියදම් | (3,165) | (3,422) | (3,070) |
| **ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය / (අලාභය)** | **(11,708)** | **(12,284)** | **23,904** |
| ආදායම් බදු වියදම | 0 | 0 | (1,060) |
| **ශුද්ධ ලාභය / (අලාභය)** | **(11,708)** | **(12,284)** | **22,844** |

**ක්‍රවුන්** සමාගමේ මූල්‍ය කළමනාකරු මෙයට මාස 6 කට පෙර ඉවත්ව ඇති බවත් ගිණුම් විධායක වන **චමිලා** හට එම කාර්යයන් සිදුකිරීමට හැකියාව ඇති බැවින් පුරප්පාඩු වූ තනතුර සඳහා අලුතින් අයෙක් බඳවාගෙන නොමැති බවත් ආරම්භක සාකච්ඡාවේදී **නිහාල් මහතා** විසින් පවසා ඇත. තවද, සමහරක් ගෙවීම් වවුචර් සහ උපකාරක ලියවිලි, **ක්‍රවුන්** සමාගම විසින් සුදුසු පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි.

විගණනයෙහි ජ්‍යෙෂ්ඨ විගණක වශයෙන් ඔබ විසින් **ක්‍රවුන්** සමාගමේ විගණනයට අදාළ සමස්ත විගණන උපායමාර්ගය පිළියෙල කොට ඉන් අනතුරුව විස්තරාත්මක විගණන සැලැස්ම පිළියෙල කළ යුතුව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත ක්‍රවුන් (පෞද්ගලික) සමාගමේ** සමස්ත විගණන උපායමාර්ගය පිළියෙල කිරීමේදී සළකා බැලිය යුතු කරුණු පහක්(05) **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(b) ස්ථාවර විගණන ලිපිගොනුව පවත්වාගෙන යාම සඳහා **සීමාසහිත ක්‍රවුන් (පෞද්ගලික) සමාගමට** අදාලව ඔබ විසින් රැස්කරගත යුතු නිශ්චිත ලේඛණ පහක්(05) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 05)

(c) විගණකයෙකුට ප්‍රමාණාත්මකභාවය වැදගත්වීමට හේතු හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(d) විගණනයට අදාලව ඔබ විසින් ලබාගත හැකි ලිඛිත නියෝජනයන් හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(B) පහත දැක්වෙන්නේ **ක්‍රවුන්** සමාගමේ වියදම් සත්‍යාපනයට අදාලව විගණන කණ්ඩායමේ කණිෂ්ඨ විගණකයින් දෙදෙනෙකු විසින් දක්වන ලද කරුණු ය:

- සංග්‍රහ වියදම් වෙනුවෙන් වූ බොහොමයක් වියදම්වලට අදාල උපකාර ලේඛණවල මුල් පිටපත් ගෙවීම් වවුචර සමඟ අමුණා නොමැති අතර, සත්‍යාපනය කිරීම සඳහා ඉල්ලූ විටද ලබාදී නොමැත. එබැවින්, ඒ සම්බන්ධ විගණන කාර්යය නිසි පරිදි සම්පූර්ණ කළ නොහැකි විය.
- 2022 මාර්තු මාසය සඳහා වූ විදුලි, දුරකතන සහ ජල බිල්පත් නොතිබූ අතර, පසුගිය මාසයේ සත්‍ය බිල්පත්වලට සමාන ප්‍රමාණයක් අදාල වියදම් ගිණුම්වලට හර කර තිබුණි.
- ලී බඩු හා උපකරණ සඳහා වූ ක්ෂය අය කිරීම් මාස තුනක් සඳහා අත්හැරී තිබූ අතර, ඒ සම්බන්ධයෙන් පැහැදිලි විස්තර කිරීමක් ලබාදීමට **චමිලාට** නොහැකි විය.

කණිෂ්ඨ විගණකයන් විසින් සඳහන් කළ ඉහත කරුණු සළකා බලා ඔවුන් විසින් හඳුනාගන්නා ලද පාලන ඌනතා විගණකයන් විසින් පාලනය සම්බන්ධයෙන් වගකීම දරණ පුද්ගලයෙක් වෙත සිදුකරන සන්නිවේදනයක් තුළ වාර්තා කළ යුතු බවට ඔබ විසින් සඳහන් කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අභ්‍යන්තර පාලනයන්ගේ දුර්වලතාවයන් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**.(ලකුණු 03)

(b) කණිෂ්ඨ විගණකයන් විසින් සඳහන් කළ කරුණු මත පදනම්ව, ඉහත සඳහන් කළ **ක්‍රවුන්** සමාගමේ අභ්‍යන්තර පාලන ඌනතාවයන්ගේ බලපෑම **තක්සේරු කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) **ජාලිය,** ඔබගේ මිතුරෙකු වන අතර, ඔහුට ඔහුගේ පවුලේ ව්‍යාපාරයක් වන **සීමාසහිත ජාලිය බතික් (පෞද්ගලික) සමාගමෙහි (ජාලිය බතික්)** 40% ක කොටස් හිමිකාරිත්වයක් ඇත. ඔහුගේ පියාගේ තනි පුද්ගල ව්‍යාපාරය ඔහු විසින් පසුගිය වර්ෂයේදී පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනට කළ බව ඔහු ඔබට ආඩම්බරයෙන් පවසන ලදී. ඔහුගේ පියාට සමාගමේ ඉතිරි 60% ක කොටස් ප්‍රමාණය අයත් අතර, ඔහු සමාගමේ සභාපති ධූරය දරයි.

**ජාලිය,** ව්‍යාපාරය පුළුල් කිරීමට අදහස් කරනු ලබන අතර, නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ඔහු ඔබගේ සහාය පතයි. **ජාලිය** විසින් ඔහුගේ වර්තමාන ව්‍යාපාර කටයුතු පිළිබඳව සඳහන් කළ වැඩිදුර තොරතුරු පහත දැක්වේ:

- ඔහු සහ ඔහුගේ පියා යන දෙදෙනාම ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතුවලට ප්‍රධාන වශයෙන් නිෂ්පාදන කටයුතුවලට සෘජුවම සම්බන්ධ වේ.

- සමාගමේ සේවකයන් 200 ක් සිටින අතර වාර්තා පවත්වාගෙන යාම, වැටුප් ගෙවීම සහ ගිණුම්කරණ කාර්යයන් වැනි කාර්යාල කටයුතු සිදුකිරීම සඳහා විධායකයන් දෙදෙනෙකු සිටී. සේවකයන්ගෙන් බහුතරය ඔහුගේ ගමේ පුද්ගලයන් වන අතර, ඔහුගේ පියා දන්නා හඳුනන අය වේ.

- ඔහුගේ පියා විසින් අවංකභාවය සහ ආචාරධර්මවලට ඉහළ වටිනාකමක් ලබාදෙන අතර, තමාව උදාහරණයක් ලෙස දක්වමින් ඒවා සිය සේවකයන් තුළද ඇතිකරලීමට නායකත්වය ලබාදෙයි. ඔහු විසින් මහන්සිවී වැඩකරන කුසලතාවයන්ගෙන් පිරි සේවකයන් සඳහා පිළිගැනීමක් සහ වැටුප් වර්ධකයන් ලබා දේ. නමුත් ඔහුගේ පියාගේ පරිචය වනුයේ විශ්වසනීයත්වය මත පදනම්ව වැඩ කිරීම වන අතර, ඒ නිසා කිසිදු ප්‍රධාන ව්‍යාපාරික කටයුත්තක් වෙනුවෙන් විධිමත් ක්‍රියාවලීන් හෝ පාලනයන් ස්ථාපිත කර නැත.

- නිශ්චිත තොග ඇණවුම් සභාපතිවරයා විසින් සෘජුවම ලබාගන්නා අතර, ඒවා සම්පූර්ණ කළ බවට ඔහුගේ මතකය අනුව තහවුරු කර ගනී.

- වර්තමාන ව්‍යාපාර කටයුතුවල ස්වභාවය සහ ප්‍රමාණය අනුව වර්තමාන සංවිධාන ව්‍යුහය ප්‍රමාණවත් බව **ජාලිය** විශ්වාස කරයි.

- කෙසේනමුත්, විශේෂයෙන් ප්‍රධාන තරඟකරුවන් විසින් හඳුන්වාදෙන ලද අන්තර්ජාලය පදනම් කරගත් විකුණුම් පද්ධතීන් නිසා නිරන්තරයෙන් වර්ධනය වන තරඟකාරිත්වය හේතුවෙන් ඔහුට දැනට සිදුකරගෙන යන ව්‍යාපාර පුළුල් කිරීමේ කටයුතු පිළිබඳව සැකයක් ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත කරුණු අනුව, **ජාලිය බතික්** හි දුර්වල යැයි පෙන්නුම් කෙරෙන, අභ්‍යන්තර පාලන පද්ධතියෙහි (COSO ආකෘතිරාමුවට අනුව) මූලිකාංග **හඳුනාගන්න.** (ලකුණු 05)

(b) **ජාලිය බතික්** සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් වැදගත්වීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) අභ්‍යන්තර පාලන පද්ධතියක ආවේණික සීමාවන් (inherent limitations) දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(B) ක්‍රියාවලින් වර්ධනය කිරීමට මහ පෙන්වීමක් ඔබ වෙතින් ලබාගැනීමේ අරමුණින් මුදල් කළමනාකරණ ක්‍රියාවලියට අදාල පහත සඳහන් තොරතුරු **ජාලිය** විසින් ඔබවෙත ලබා දී ඇත:

- සිල්ලර හෝ තොග අයිතමයන්ට අදාලව මුදල් හා චෙක්පත් විධායකයන් දෙදෙනා අතුරෙන් එක් අයෙකු විසින් එකතු කර ගනී. එම සියලු විකුණුම්, කර්මාන්තශාලාවට යාබදව ඇති සමාගමේ ප්‍රධාන ගබඩාව තුලින් සිදුවේ.
- සිය පියාගේ මහ පෙන්වීමට අනුව, ඔවුන් මුදල් ලැබීම්, මුදල් පොතක සාමාන්‍යයෙන් වාර්තාකරන අතර, එක් විධායකයෙකු විසින් එකතු කරගන්නා චෙක්පත් බැංකුගත කරන තෙක් ලාච්චුවෙහි තබා ගනී.
- විකුණුම්වලින් එකතුකරගත් මුදල් එදිනෙදා වියදම් සඳහා භාවිත කර ඉතිරි මුදල්, චෙක්පත්ද සමඟ සාමාන්‍යයෙන් සතිය අවසානයේදී බැංකුගත කරයි.
- යම් දෙනලද අවස්ථාවකදී සමාගමේ මෙහෙයුම් වියදම් සඳහා වෙන්කොට තබාගන්නා ලද මුදල් සැලකිය යුතු ප්‍රමාණයක් පවතින අතර, ඒවා අතැති මුදල් ලෙස හෝ ඉතුරුම් තැන්පතු ලෙස පවතී.
- තැන්පත්කරන ලද චෙක්පත් උපලබ්ධිවීමට ප්‍රමාද වන බැවින් බැංකු ගිණුම් ශේෂයන් සමඟ මුදල් පොතේ ශේෂය කිසිවිටෙකත් නොගැලපේ. බැංකු ප්‍රකාශන ලැබුනු පසු විධායකයන් විසින් කිසිදු වැඩිදුර ක්‍රියාමාර්ගයක් නොගනී.

තවද, **ජාලිය බතික්** හි ප්‍රධාන ක්‍රියාවලින් පරිගණකගත කිරීමේ මූලික පියවරක් වශයෙන් පොදු ලෙජරය, තොග සහ ණයහිමි මොඩියුලයන්ගෙන් සමන්විත ඔවුන් සඳහාම වැඩිදියුණු කරන ලද පද්ධතියක් ස්ථාපිත කිරීමට **ජාලිය** අදහස් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **ජාලිය බතික්** හි ඉහත මුදල් කළමනාකරණ ක්‍රියාවලිය තුළ පවතින අභ්‍යන්තර පාලන දුර්වලතාවයන් (weaknesses) පහක්(05) **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(b) ඉහත දුර්වලතා මගහරවා ගැනීම සඳහා එක් නිර්දේශය බැගින් **සඳහන් කරන්න.** (ලකුණු 05)

(c) **ජාලිය** විසින් ඉහත තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේදී සලකා බැලිය හැකි පොදු තොරතුරු තාක්ෂණ පාලනයන් දෙකක්(02), එක් එක් පාලනය සඳහා උදාහරණයක් ද සමඟ **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |